## මූලික තොරතුරු පත්‍රිකාව

# (පෞද්ගලික නොවන) ආයෝජන ඉතුරුම් ගිණුම

| නිෂ්පාදනයේ ස්වභාවය | මූලිකාංග සහ ප්‍රතිලාභ | මූලික තැන්පතුව සහ ගාස්තු | පහසුකම් | මූලික නියමයන් සහ කොන්දේසි |
|---|---|---|---|---|
| සමිති සඳහා විශේෂ ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ගිණුම | **පොලී අනුපාතය:**<br><br>011 5411411 දුරකතන අංකය අමතා හෝ https:// www. sdb.lk/ en/rates ලෙසින් වන අපගේ නිල වෙබ් අඩවියට ඔබට වැඩිදුර විස්තර ලබාගත හැකිය.<br><br>**මූලිකාංග:**<br><br>• ගිණුමේ දෛනික ශේෂය ගණනය කර ඒ අනුව එකතු වන පොලිය මාසය අවසානයේදී ගිණුමට බැර කෙරෙනු ඇත.<br><br>• ගිණුමේ ශේෂය ස්ථාපිතව පවත්වා ගෙන යාමට එකඟ වී ඇති කාල සීමාව තුළ මෙම ගිණුම්වලින් නැවත මුදල් ලබාගැනීමට නොහැකිය. අවම වශයෙන් වසරක කාල සීමාවක් සඳහා වන ගිණුම කල් පිරෙන වටිනාකම, පස් වසරකට හෝ ඊට පෙරාතුව ලැබෙන ප්‍රතිලාභ යන කරුණු බැංකුව විසින් තීරණය කෙරෙනු ඇත.<br><br>• SDB ආයෝජන ඉතුරුම් සැළසුම සඳහා මාසිකව තැන්පතු කළ යුතු මුදල අදාළ දිනයට හෝ ඊට පෙර ගෙවීම ගනුදෙනුකරු සතු වගකීම වේ.<br><br>• අදාළ දිනයට හෝ ඊට පෙර ගෙවීම සිදු කිරීමට ගනුදෙනුකරු අපොහොසත් වුවහොත්, ඉලක්කගත කල් පිරීමේ වටිනාකම ගිණුම කල් පිරෙන දිනට ගෙවනු නොලබන අතර එවන් අවස්ථාවලදී අදාළ මාසික වටිනාකම ගනුදෙනුකරු විසින් ගිණුමට බැර කළ යුතු වේ.<br><br>**මූල්‍ය ප්‍රතිලාභ සහ දිරිදීමනා, ප්‍රවර්ධන ඇතුළු අනෙකුත් ප්‍රතිලාභ:**<br><br>• ගිණුමේ තත්ත්වය සහ ගනුදෙනු වාර්තා නිරීක්ෂණය වෙනුවෙන් පාස්පොත් පහසුකම හිමි වේ. | • මූලික තැන්පතුව සහ අවම ගිණුම් ශේෂය පිළිබඳව තොරතුරු ඔබට 011 5411411 දුරකතන අංකය අමතා හෝ ළඟම SDB ශාඛාවට පිවිස ලබාගත හැක.<br><br>• ගිණුම පවත්වාගෙන යාම, අනෙකුත් ගාස්තු සහ ගිණුම වසා දැමීම සම්බන්ධ ගාස්තු සඳහා https: //www.sdb.lk/ en/ fees-and-charges වෙබ් අඩවියට පිවිසෙන්න.<br><br>• 011 5411411 දුරකතන අංකය හරහා අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ https://www.sdb.lk ලෙසින් වන අපගේ නිල වෙබ් අඩවියට ඔබට වැඩිදුර විස්තර ලබාගත හැකිය. | සමිති සඳහා ගිණුම් විවෘත කිරීමේ හැකියාව ඇත.<br><br>**ගිණුම් විවෘත කිරීම, කල් පිරීමට පෙර මුදල් නැවත ලබා ගැනීම, මූල්‍ය ගනුදෙනුකරුවන් විසින් අරමුදල් මාරු කිරීම හා සම්බන්ධ වන සීමාවන් පිළිබඳව තොරතුරු:**<br><br>ඔබට ළඟම SDB ශාඛාවට පිවිස ලබාගත හැක.<br><br>**ගිණුම් විවෘත කිරීම සඳහා වන ක්‍රියා පිළිවෙළ:**<br><br>011 5411411 දුරකතන අංකය හරහා අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ ඔබට ළඟම SDB ශාඛාවට පිවිස අදාළ තොරතුරු ලබාගත හැක. | කල්පිරීමට පෙර මුදල් නැවත ලබා ගැනීම - අදාළ වන සම්මත ඉතිරුම් පොලී අනුපාතය.<br><br>නියාමන සහ කොන්දේසි පිළිබඳව වැඩිදුර විස්තර සිංහල භාෂාවෙන් ලබා ගැනීම සඳහා කරුණාකර පහත වෙබ් යොමුව භාවිතා කරන්න: https://www.sdb.lk/images/pdf/downloads/society-time-mandate-sinhala.pdf.<br><br>නියාමන සහ කොන්දේසි පිළිබඳව වැඩිදුර විස්තර දෙමළ භාෂාවෙන් ලබා ගැනීම සඳහා කරුණාකර පහත වෙබ් යොමුව භාවිතා කරන්න: https://www.sdb.lk/images/pdf/downloads/society-time-mandate-tamil.pdf |

#ඔබවවටින

# මූලික තොරතුරු පත්‍රිකාව
# (පෞද්ගලික නොවන) ආයෝජන ඉතුරුම් ගිණුම

**තැන්පතු රක්ෂණ ආවරණය/අවසරයෙන් තොරව (අත්වැරදීමෙන්) සිදු කෙරුණු ගනුදෙනු වාර්තා කිරීම/අක්‍රීය ගිණුම්/අත්හරින ලද දේපල.**

- මුදල් මණ්ඩලය විසින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ වැඩසටහන යටතේ තැන්පතු වගකීම් බැංකුව විසින් රක්ෂණය කර ඇති අතර ඊට අය කෙරෙන මුදල වෙනුවෙන් තැන්පතුකරුවෙක් හට රුපියල් 1,100,000/= ක උපරිමයක් දක්වා වන්දි හිමි වෙනු ඇත.
- අවසරයෙන් තොරව හෝ අත්වැරදීමෙන් සිදු කෙරුණු ගනුදෙනුවක් හඳුනාගත් වහාම ගිණුම පවත්වා ගෙන යන බැංකු ශාඛාවට දැනුම් දීම හෝ 011 5411411 දුරකතන අංකය හරහා අපේ සේවා මධ්‍යස්ථානය අමතා දැනුම් දිය යුතුය.
- වසර දෙකක් පුරාවට ගිණුමට මුදල් බැර කිරීමක් හෝ ගිණුමෙන් මුදල් ලබා ගැනීමකින් තොරව පැවතුණ හොත් එම කාලය අවසානයේදී ගිණුම නිෂ්ක්‍රීය වශයෙන් සළකනු ඇත.
- යම් ගිණුමක් වසර 10 ක කාලයක් පුරා කිසිදු ක්‍රියාකාරකමකින් තොරව පැවතුණ හොත් එම කාල පරිච්ඡේදය අවසානයේදී එම ගිණුම අත්හැර දමන ලද දේපලක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වාර්තා කෙරෙනු ඇත.

**අපගේ නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ ගාස්තු සහ ගෙවීම් පිළිබඳව වැඩිදුර විස්තර** ඔබට 011 5411411 දුරකතන අංකයෙන් අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ https://www.sdb.lk ලෙසින් වන අපගේ නිල වෙබ් අඩවියට පිවිස ලබාගත හැකිය.

**පැමිණිලි සිදු කරන පිළිවෙල:**

ගනුදෙනුකරුවන් හට ඔවුන්ගේ යෝජනා සහ පැමිණිලි පහත සඳහන් ආකාරයට යොමු කළ හැක.

- 011 5411411 දුරකතන අංකයෙන් අපේ සේවා මධ්‍යස්ථානය අමතා හෝ 011 2832571 දුරකතන අංකය/customercare@sdb.lk ඊ මේල් ලිපිනය හරහා ප්‍රධාන කාර්යාලයේ පිහිටා ඇති පාරිභෝගික පැමිණිලි අංශයට යොමු කිරීමෙන් හෝ පැමිණිලි භාර ප්‍රධාන නිලධාරියා වෙත headfcp@SDB.lk ඊ-මේල් ලිපිනය හරහා පැමිණිලි යොමු කිරීම සිදු කළ හැක. පැමිණිලි සිදු කරන පිළිවෙල පිළිබඳව වැඩිදුර විස්තර සඳහා https://www.sdb.lk යොමුව හරහා අපේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

**ඔබේ පැමිණිලි තැපැල් මගින් යොමු කිරීමට:**

භාර නිලධාරී - පාරිභෝගික පැමිණිලි භාර ගැනීමේ අංශය,
ප්‍රධාන කාර්යාලය, SDB බැංකුව, අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන, කොළඹ 06.

අපේ නිෂ්පාදන සහ සේවාවන්ට අදාළ තොරතුරු ලබා ගැනීමට හෝ වෙනත් කරුණක් සම්බන්ධයෙන් අප හා සම්බන්ධ වීමට ඔබට අවශ්‍ය නම් සමීපතම ශාඛාවට පිවිස හෝ අපේ දුරකතන සේවා මධ්‍යස්ථානය අමතා හෝ එය සිදුකළ හැක. සමීපතම SDB ශාඛාව පිළිබඳව දැන ගැනීමට 011 5411411 දුරකතන අංකයෙන් අපේ සේවා මධ්‍යස්ථානය අමතන්න. නැතිනම් https://www.sdb.lk යොමුව හරහා අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න.

SDB බැංකුව

#ඔබවවටින